


# පැටිය වදන්නෙ බක් මහේ ඉපනැල්ලට

රාත්‍රිය බොහෝ සුන්දරව ගෙවී ගියා . හිරු නැරෙන වෙලාවෙ වැව ළඟට ආවෙ කරඳ කෝටු කෑල්ලකින් දත් මදිමින්.

"අයියණ්ඩි මේ මගුල් කරඳ කොටු වලින් දත කට මැද්දාම ලෙඩ හැදෙන්නෑ.. දත් හයි හත්තිය වෙනවා.. "

"හැබෑද නගා..?"

"අපි වාගෙ නෙවෙයි.. දළදා රටේ ඈයො දත කට මදින්නෙ ඒරොප්පෙන් ගෙනාව ලාටු වලින් නේද? ඔහොම ඉඳ අයියණ්ඩි වතුරට නොබැහැ.."

"අර මොකෑ..?"

"රාත්තිරියෙ ආව සතා සරුපයා ඉන්ට බැරි නැහැ.. ආන්තරාවක් නැතුවා.. වරෙන්.. විගැහින් මූණ කට පිහදා ගනින් පැලට යන්ට.. අපුච්චා ගෙදර දීවෙ මුං කිරිබත් ඇන්න එන්ට.."

"අඩෙ අප්පා.. කොච්චි මිරිසුත් තලං එනවා කිව්වද?"

"මොකැ නැතුවා.. උන්දෑ දන්නවා උඹ කොච්චි මිරිස් තලියක් එක්ක කිරිබත් ගිලින්ට මනාපයි කියලා.."

"යම නගා.. මොකැ අප්පුච්චා මා ගැන කියන්නෙ?"

"උඹට පන ඇරලා.. "

"ඒ මොකෑ..?"

"උන්දැගෙ එකම මලයා නයා ගහලා මරු ඉම ඉන්න වෙලේ කුදලාගෙන වෙදරාළ ළඟට නොගියා නම් උන්දෑ කම්මුතුයි.. එදා උඹ ගිඩි ගිඩියෙ උන්දැව දොක්කාන වෙලාව අවේලාව නොබලා ගිය එක ගැන හරි ලෙංගතු කමක් උන්දැගෙ පපු කැනැත්තෙ පැලපදියං වෙලා තියෙන්නෙ.. උන්දෑ කියනවා අයියණ්ඩි මෙහෙ ඉන්නකං රැක බලා ගන්ඩය ඒ ඇත්තො යන දොහක හිතේ හාංකාවක් නැතුව යන්ට අරින්ටය කියලා.. "

"ආං අප්පුච්චා වැට ඉන්නවා.. "

"මාමා කිරිබත් ගෙනාවාද..? "

"කෙලී ඉක්මන් කර බත හීල්වෙන්ට කලින් ගිලදාන්ට.. එතකොට තමයි අපූරුව.."

මා කන අයුරු බලා සිටි මලී තවත් කිරිබත් ටිකක් පතට බෙදන ගමන් "අයියණ්ඩි කිරිබත් ගිලින්න හරි රුසියෙක්.." කියා කීවා ය.

"කෙලී බත් පත අත තියෙන වෙලාවට එහෙම නොකිය.. ඒ ඇත්තෝ මනාප දෙයක් තියෙනවා නම් හරි කොරල දී... මං යනවා ටිකිරගේ පැල් කොටේ හෙවිල්ලන්ට.. මාදං වැටිය දිහා හෙම නොයව්.. "

"මොකෑ මාමා..? කිරිබත් ගිල්ලම මාදං ගිලින්ට තහංචියැ..?"

"නැතුවා.. ගෝන ගලේ බන්ඩා කියැව්වා ඒ ඉම කුළා නෑම්බිට රැකුම්ලනවා.. "

"අපි ගියාම ඌට මොකෑ.."

"මේ අහ.. කුලා මනාප නැතුවා ඇහැ ගැහෙනවට.. ඇහැ ගැහුනොත් පස්සෙන් අඹලා අංකෙටියෙන් ඇනලා බිම දාලා මිස පස්ස බලනවා බොරුයි.. බෝ දන්නෙ නෑ රඟ.. පැටියා වදලා මහත්වෙනකල් ඕකා නෑම්බි පස්සෙ.."

"කොයි කාලෙටද පැටියා වදනන්නෙ..?"

"වැඩි දොහක් නෑ.ඩ මේ කරුවල රාත්තිරිය ඉවර වුණාම බක් මහේ ඉපනැල්ලට පැටියා වදයි.. "

"මට ඇති නගා.. "

"එහෙනං අත කට පිහදාගෙන මේ තේ කහට එක බී.."

"බඩගෙඩිය උහා ගන්ඩ බැරුවා.. කොහේ තේ කහට බොන්ඩද?"

"එහෙනං යමු.. කොයින් ආතා ඇස්ගෙඩි දෙක උලුප්පාන ඇති උඹ ඇහැ ගැහෙනකල්.. අද ගිඩි ගිඩිය ගෙනයන්නෙ නැතුවා.. කැලෑ දෙරි ගහනා එවුන් උඹ නැත්නං අඩුක්කුව ගිල දාල රුප්පෙ දපා තියයි... කැලෑ දෙරි ගැහිල්ල පැත්තක තියලා.. ඕකලා මට නං දෑහට පේන්ට බැරුවා.. ගිලින්ට වගේ ඇසි ගෙඩි උලුප්පන්නෙ.. "

"ආං ආතා පිල්කොටේ අන තියාන බලා ඉන්නවා වැට ඉම.. උඹ ඇහැ ගැටුනා නොවැ.. දැන් උන්දැගෙ කැවුත්තෙ ගිඩි ගිඩි ගාන එක හරි වෙයි..."

බෝගල

YSL
Migration
Services

We specialise in

General Skilled Migration Visas
Applications for State Migration Plans
Onshore|Offshore Partner Visas
Sponsored Visitor|Tourist Visas
Student Visas
Parent Visas

Yashodhara Sarachchandra Liyanaarachchi
(Registered Migration Agent)
MARN: 0746956
0430 359 006

(Close to Latrobe university , RMIT and NMIT)
6 Mat Rush Avenue, Bundoora, VIC 3083
Tel: 03 9467 4468
yasho@yslmigration.com

MIGRATION AGENT REGISTERED mara.com.au REGISTRATION NUMBER 0746956
MIA MEMBER OF MIGRATION INSTITUTE OF AUSTRALIA